ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2512/20 – 2026 ඔක්තෝබර් මස 27 වැනි අඟහරුවාදා – 2026.10.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2026 නොවැම්බර් මස 16 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතුය.

එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද,
සභාපති,
මෝටර් රථ ගමනාගමන කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2026 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 05.
"මෙහෙවර පියෙස",
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A – G 048419 – 08 (2026/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1947 පෙබරවාරි මස 14 වැනි දින අංක 9667 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද,අවසන් වරට 2019 ජනවාරි මස 30 වැනි දින අංක 2108/35 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනය මඟින් වෙනස් කරන ලද්දා වූ තීරණ පහත දැක්වෙන පරිදි තවදුරටත් එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II වන කොටස

අවම මාසික වේතනය

කම්කරුවන්ගේ පන්තිය

‘ඒ’ පන්තියේ කම්කරුවෝ

මඟින් 22 කට වැඩියෙන් ගෙනයාමට අවසර ලත් බස්රථ රියදුරෝ

‘බී’ පන්තියේ කම්කරුවෝ

මඟින් 22 ක් හෝ ඊට අඩු ගණනක් ගෙනයාමට අවසරලත් බස්රථ රියදුරෝ, ගිලන් රථ රියදුරෝ හා හොණ්ඩර 20 කට වැඩි බර ගෙන යාමට අවසරලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නාවූ ලොරි හැර) හා වෑන් රථ රියදුරෝ.

‘සී’ පන්තියේ කම්කරුවෝ

කුලී කාර් සහ කැබ් රථ රියදුරෝ, හොණ්ඩර 20 හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නාවූ ලොරි හැර) හා වෑන් රථ රියදුරන්, ත්‍රීරෝද රථ රියදුරන් හා මිනී රථ රියදුරන්.

‘ඩී’ පන්තියේ කම්කරුවෝ

ප්‍රවාහන කාර්යයන් සඳහා යොදවනු ලබන ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් රථ පදවන රියදුරෝ හෝ ට්‍රේලර් සහිත ලොරි පදවන රියදුරෝ (ස්කැමල් හෝස් වර්ගයේ ඒවා ඇතුළුව - එහෙත් වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ට්‍රේලර් සහිත ලොරි, ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් හැර)

‘ඊ’ පන්තියේ කම්කරුවෝ

වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ පහත සඳහන් වන රථවල රියදුරෝ, එනම් (අ) ලොරි සහ (ආ) ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් රථ.

‘එෆ්’ පන්තියේ කම්කරුවෝ

බස්රථවල නියුක්ත කොන්දොස්තරවරු, ලිපිකරුවෝ, කෑෂියර්වරු, ප්‍රවේශපත්‍ර ලිපිකරුවෝ, ආසන වෙන් කරන ලිපිකරුවෝ.

‘ජී’ පන්තියේ කම්කරුවෝ

හොණ්ඩර 20 කට වැඩි බර ගෙන යාමට අවසරලත් ලොරිවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

‘එච්’ පන්තියේ කම්කරුවෝ

හොණ්ඩර 20 හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරිවල සහ බස්රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හා මිනී රථවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

'අයි' පන්තියේ කම්කරුවෝ

බස්රථ චෙකර්වරු හෝ වේලාව තබන්නෝ.

'ජේ' පන්තියේ කම්කරුවෝ

බස්රථ පරීක්ෂකවරු සහ නැවතුම්පොළවල පරිපාලකවරු.

'කේ' පන්තියේ කම්කරුවෝ

මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි යෙදී සිටින එහෙත්, මෙහි ඉහත කොටස්වල සඳහන් නොවූ කම්කරුවෝ.

ඉහත සඳහන් තීරණවල -

(අ) ''ක්ලීනර්වරු'' යන්නෙන් ලොරි, බස්රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හෝ මිනී රථ පිරිසිදුව තබා ගැනීමෙ යොදවා සිටින (ලියකියවිලි වැඩෙහි නිරත සේවකයින් නොවන) කම්කරුවන් අදහස් කරනු ලැබේ.

(ආ) ''පෝටර්වරු'' යන්නෙන් ලොරි, බස්රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හෝ මිනී රථ යන මේවාට බඩු පැටවීමෙහි හෝ ඒවායේ බඩු බෑමෙහි යොදවා සිටින හා ඔවුන්ගේ වැඩ සම්බන්ධයෙන් ඒ රථවලම ගමන් කිරීමට සිදුවන කම්කරුවන් අදහස් කරනු ලැබේ.

II වැනි කොටස

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

ආයතනයේ සේවා වර්ෂය	ඒ පන්තිය ඩී පන්තිය	බී පන්තිය	සී පන්තිය	ඊ පන්තිය එෆ් පන්තිය ජේ පන්තිය	ජී පන්තිය අයි පන්තිය	එච් පන්තිය	කේ පන්තිය
1 වන වසර	33525.00	33150.00	32740.00	32440.00	32100.00	31840.00	31500.00
2 වන වසර	33925.00	33500.00	33040.00	32690.00	32300.00	32040.00	31700.00
3 වන වසර	34325.00	33850.00	33340.00	32940.00	32500.00	32240.00	31900.00
4 වන වසර	34725.00	34200.00	33640.00	33190.00	32700.00	32440.00	32100.00
5 වන වසර	35125.00	34550.00	33940.00	33440.00	32900.00	32640.00	32300.00
6 වන වසර	35525.00	34900.00	34240.00	33690.00	33100.00	32840.00	32500.00
7 වන වසර	35925.00	35250.00	34540.00	33940.00	33300.00	33040.00	32700.00
8 වන වසර	36325.00	35600.00	34840.00	34190.00	33500.00	33240.00	32900.00
9 වන වසර	36725.00	35950.00	35140.00	34440.00	33700.00	33440.00	33100.00
10 වන වසර	37125.00	36300.00	35440.00	34690.00	33900.00	33640.00	33300.00
11 වන වසර	37525.00	36650.00	35740.00	34940.00	34100.00	33840.00	33500.00
12 වන වසර	37925.00	37000.00	36040.00	35190.00	34300.00	34040.00	33700.00
13 වන වසර	38325.00	37350.00	36340.00	35440.00	34500.00	34240.00	33900.00
14 වන වසර	38725.00	37700.00	36640.00	35690.00	34700.00	34440.00	34100.00
15 වන වසර	39125.00	38050.00	36940.00	35940.00	34900.00	34640.00	34300.00

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.